# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 1 දරන ජාතික ආධුනිකත්ව (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 ජනවාරි මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 ජනවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 1 දරන ජාතික ආධුනිකත්ව (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 ජනවාරි මස 20 වන දින]

එල්.ඩී.—ඕ. 17/85

## 1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 1988 අංක 1 දරන ජාතික ආධුනිකත්ව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1971 අංක 49 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇඇ) යම් තැනැත්තකු විසින් භාජනය විය යුතු ජාතික වෘත්තීය පරීක්ෂණ නිශ්චය කිරීම සහ සුදුසුකම් ලබන තැනැත්තන්ට ජාතික වෘත්තීය සහතික නිකුත් කිරීම;".

ප්‍රධාන ප්‍රඥප්තියට 7අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. 7 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"ජාතික වෘත්තීය පරීක්ෂණ පැවැත්වීමේ බලය.

7අ. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන වෘත්තීන් සම්බන්ධයෙන්, ජාතික වෘත්තීය පරීක්ෂණ පැවැත්වීමේ බලය මණ්ඩලයට තිබිය යුතු ය.

(2) ජාතික වෘත්තීය පරීක්ෂණයකට පෙනී සිටීමට පහත සඳහන් තැනැත්තෝ සුදුසුකම් ලබත් නාහ:—

(අ) වෘත්තීය පරීක්ෂණයකට භාජනය වී මණ්ඩලය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන ආධුනිකයෝ; සහ

(ආ) යම් විශේෂ වෘත්තියක ප්‍රමාණවත් පුහුණුවක් ලබා ඇති බවට මණ්ඩලය අදහස් කරන, ආධුනිකයන් නොවන තැනැත්තෝ.

2—ඒ 096935 7,235 (87/08)

(3) ජාතික වෘත්තීය පරීක්ෂණයකට පෙනී සිටීම පිණිස ලියාපදිංචි කරනු ලැබීමේ කාර්ය සඳහා, (2) වන උපවගන්තිය යටතේ පුහුණුකම් ලබන තැනැත්තකු විසින්, නියමිත ආකෘති පත්‍රයෙහි, මණ්ඩලය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(4) ජාතික වෘත්තීය පරීක්ෂණයකින් සමත් වී, ඒ මගින් යම් වෘත්තියකට අවශ්‍ය නිපුණතාව සහ කාර්යක්ෂමතාව ලබා සිටින සෑම තැනැත්තකු වෙත ම, මණ්ඩලය විසින්, ජාතික වෘත්තීය සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.